උදා: $-y = 2x^2 - 3$ ශ්‍රිතයේ ප්‍රස්තාරය පහත දී ඇති අගය වගුව ඇසුරෙන් අඳිමු.




<u>ඉහත ප්‍රස්තාරය තුළ ඇති ප්‍රදේශ පිළිබඳ පහත වගුවේ දැක්වේ.</u>

| ප්‍රස්තාරය මත එක් එක් ප්‍රදේශ | එම ප්‍රදේශවලදී y හි හැසිරීම | එම ප්‍රදේශ අයත් x හි අගය පරාසය | එම ප්‍රදේශවල වැදගත්කම |
|---|---|---|---|
| A – B | ධනව අඩු වේ | $x < -1.2$ | ශ්‍රිතයේ අගය ධනව අඩු වන $x$ හි අගය පරාසය |
| B | 0 ක් වේ. | $x = -1.2$ | $2x^2 - 3 = 0$ සමීකරණයේ සෘණ මූලය |
| B – C | සෘණව අඩු වේ. | $-1.2 < x < 0$ | ශ්‍රිතයේ අගය සෘණව අඩු වන $x$ හි අගය පරාසය |
| C | -3 ක් වේ. | $x = 0$ | අවම අගය |
| C – D | සෘණව වැඩි වේ. | $0 < x < 1.2$ | ශ්‍රිතයේ අගය සෘණව වැඩි වන $x$ හි අගය පරාසය |
| D | 0 ක් වේ. | $x = 1.2$ | $2x^2 - 3 = 0$ සමීකරණයේ ධන මූලය |
| D - E | ධනව වැඩි වේ. | $x > 1.2$ | ශ්‍රිතයේ අගය ධනව වැඩි වන $x$ හි අගය පරාසය |

**<u>$y = 2x^2 - 3$ ප්‍රස්තාරය,</u>**

**පරාවලයකි.අවම අගය - *3* වේ.අවම ලක්ෂ්‍යයේ ඛණ්ඩාංකය (*0* , *-3*) වේ.සමමිතික අක්ෂයේ සමීකරණය $x = 0$ වේ.**

- **x හි අගය - 1.2 තෙක් සෘණව වැඩි වන විට ප්‍රස්තාරය ධනව අඩු වේ.**
  **එනම් ප්‍රස්තාරය ධනව අඩු වන පරාසය $x < -1.2$ වේ.**
- **මෙලෙස තවත් දැකිය හැකි විශේෂ ලක්ෂණ ලියන්න .**